*සැ. යු.* - 2021.04.30 වැනි දින අංක 2226 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,227 - 2021 මැයි මස 07 වැනි සිකුරාදා - 2021.05.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1090 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1095 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1098 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 මැයි මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මැයි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## සබරගමුව පළාත්බඳ ඇඹිලිපිටිය මහාධිකරණය

සබරගමුව පළාත්බඳ ඇඹිලිපිටිය මහාධිකරණයේ අවසන් නඩුවලට අදාළ නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් අවසන් නඩුවලට අදාළ නඩු භාණ්ඩ 2021.05.21 සිකුරාදා පෙ. ව. 10.00 ඇඹිලිපිටිය මහාධිකරණ භූමියේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වෙන්දේසි කිරීමට ප්‍රථම පැය භාගයකට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. මෙම භාණ්ඩ මිලදී ගන්නා අය මුදල් ගෙවා රිසිට් පත ලබාගෙන මිලදී ගත් භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. තවද, එම භාණ්ඩ මිලදී ගන්නා අය ස්වකීය හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර ගෙවීම් සඳහා චෙක්පත්, මුදල් ඇණවුම් කිසිවක් භාර නොගන්නා බව ද මෙයින් දැනුම් දෙමි.

කවීන්ද්‍රා නානායක්කාර,
මහාධිකරණ විනිසුරු,
සබරගමුව පළාත්බඳ මහාධිකරණය,
ඇඹිලිපිටිය.

2021 අප්‍රේල් මස 27 වැනි දින,
ඇඹිලිපිටිය මහාධිකරණයේ දී ය.

### වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ සම්බන්ධ ලේඛනයේ උපලේඛනය

| නඩු අංකය | නඩු අංකය | ප්‍රමාණය | විස්තරය |
|---|---|---|---|
| 01. | HCE 23/2016 | 01 | SP QH 6514 දරන බජාජ් වර්ගයේ කොළ පැහැති ත්‍රී රෝද රථය හා ස්විච් යතුර |
| 02. | HCE 27/2018 | 01 | SG VV - 6837 දරන බජාජ් ඩිස්කවරි වර්ගයේ යතුරු පැදිය |
| 03. | HCE 2/2018 | 01 | SG - ABD 9062 දරන පියාජියෝ ත්‍රී රෝද රථය |
| 04. | HCE 34/2019 | 01 | ස්කුරුප්පු නියන |
| 05. | HCE 107/2016 | 01 | පිහිය (විශේෂ හැඩැති) |
| | | 01 | පොරව |
| | | 01 | උදැල්ල |
| 06. | HCE 122/2019 | 01 | Hello වර්ගයේ ජංගම දුරකථනය |
| 07. | HCE 45/2014 | 01 | කලුපාට හෙල්මට් 01 |
| | | 01 | ජැක් 01 |
| | | 01 | බෆල් 01 |
| 08. | HCE 42/2019 | 01 | ඇලිස් කටු 01 |
| 09. | HCE 73/2018 | 01 | කලුපාට හෙල්මට් 01 ජැක් 01, බෆල් 01 |
| 10. | HCE 45/2018 | 01 | යකඩ කුරු කැබැල්ල (අඩි 1 අඟල් 11 පමණ දිග) |
| 11. | HCE 75/2018 | 01 | 5 KG ප්‍රමාණයේ කුඩා තරාදි 01 |
| 12. | HCE 19/2011 | 01 | සෝනි එරික්සන් වර්ගයේ ජංගම දුරකථන 01, මුදල් පසුම්බි 01, රතුපාට හිස්වැසුම් 01 |

කාර්යාල භාවිතයෙන් ඉවත් කරන ලද -

| | | | |
|---|---|---|---|
| 13. | කාර්යල භාවිතයෙන් ඉවත් කරන ලද | 02 | වානේ අල්මාරි |
| 14. | එම | 01 | යතුරු ලියන පුටු |
| 15. | එම | 01 | පොත් රාක්ක |
| 16. | එම | 01 | විදුලි පංකා |

05-161

**මහෙස්ත්‍රාත් අධිකරණය - කුරුණෑගල**

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදලව රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ හා වර්ෂ 2021.05.22 වැනි දින පැය 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. වෙන්දේසි සඳහා ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ එදින පැය 8.30 සිට 9.00 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබාගෙන පරීක්ෂා කිරීමට හැකි ය.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් දින පැය 9.00 ට පෙර ස්වකීය හිමිකම් මෙම අධිකරණය වෙත තහවුරු කළ යුතු ය.

03. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය.

04. අධිකරණය විසින් කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී හා වෙනත් හේතුන් මත මෙම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අභිමතය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර මිලදී ගන්නා භාණ්ඩ එදිනම පැය 16.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

බන්දුල ගුණරත්න,
මහෙස්ත්‍රාත්,
අතිරේක දිසා විනිසුරු,
කුරුණෑගල.

2021 අප්‍රේල් මස 16 වැනි දින,
කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**ප්‍රසිද්ධ වෙන්දේසිය - 2021**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ |
|---|---|---|
| 1. | 44048 | ගෑස් සිලින්ඩරය |
| 2. | 40006 | ගෑස් සිලින්ඩරය |
| 3. | 34564 | ගෑස් සිලින්ඩරය |
| 4. | 44852 | ගෑස් සිලින්ඩරය |
| 5. | 38142 | ගෑස් ලිට්රෝ සිලින්ඩරය |
| 6. | 34331 | ගෑස් සිලින්ඩරය |
| 7. | 41347 | ගෑස් සිලින්ඩරය (ලොකු) |
| 8. | 44048 | ගෑස් ලිප |
| 9. | 40006 | ගෑස් ලිප (රෙගියුලේටරය සහිත) |
| 10. | 34564 | ගෑස් ලිප (රෙගියුලේටරය සහිත) |
| 11. | 34331 | ගෑස් ලිප (රෙගියුලේටරය සහිත) |
| 12. | 44852 | ගෑස් ලිප (රෙගියුලේටරය සහිත) |
| 13. | 38142 | ගෑස් ලිප (රෙගියුලේටරය සහිත) |
| 14. | 41347 | ගෑස් ලිප (රෙගියුලේටරය සහිත) |
| 15. | 43030 | ගල් විදින යන්ත්‍රය |
| 16. | | අංක රහිත සවල් තොගය 10 |
| 17. | | අංක රහිත යකඩ බාල්දි 10 |
| 18. | | අංක රහිත පාපැදි තොගය |
| 19. | | අංක රහිත ප්ලාස්ටික් කැන් තොගය - ලොකු |
| 20. | | අංක රහිත වීදුරු බෝතල් තොගය (600 පමණ) |
| 21. | A 138/15 | පාපැදිය |
| 22. | A 1324 | පාපැදිය |
| 23. | A 1325 | පාපැදිය |
| 24. | A 1326 | පාපැදිය |
| 25. | A 793/15 | පාපැදිය |

වාහන.-

| | | |
|---|---|---|
| 26. | 81156/16 | සී පැන් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 27. | 88445 | 2268213 ලයිට් එඩ් වර්ගයේ ලොරි රථය |
| 28. | 95018/17 | SER NO 1078 සීපැන් වර්ගයේ අත් ට්‍රැක්ටරය |
| 29. | 60604 | 8458 ලොරි රථය |
| 30. | 13708/18 | NW 545509 අත් ට්‍රැක්ටරය |
| 31. | 56840 | අත් ට්‍රැක්ටරය 398854 හා ටේලරය |
| 32. | 9614/18 | NW 9522 ඩිමෝ බට්ටා ලොරි රථය |
| 33. | 78680 | NWWH 5275 යතුරු පැදිය |
| 34. | 7928/18 | RD 3692 ට්‍රැක්ටරය හා ටේලරය |

05-100

---

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - වැලිමඩ**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණයේ නඩුවලට අදල රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත විස්තර සඳහන් භාණ්ඩ වර්ෂ 2021.05.22 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් භාණ්ඩයක් හෝ භාණ්ඩ සම්බන්ධයෙන් හිමිකම් කියන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වෙන දිනට පෙර හෝ වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ලිඛිතව අධිකරණ රෙජිස්ට්‍රාර්වරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී හා අධිකරණයේ අභිමතය පරිදි වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන ගැනුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතු ය.

07. වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් වෙන්දේසිය පවත්වන වේලාවේ දී ම එය ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ප්‍රමෝද් ජයසේකර,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වැලිමඩ.

2021 අප්‍රේල් මස 06 වැනි දින,
වැලිමඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

(1) රාජසන්තක නඩු භාණ්ඩ

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 49115 | නිල් පාට බැරලය |
| 02. | 48505 | ඇලුමිනියම් මුට්ටිය<br>ප්ලාස්ටික් බකට් 01 |
| 03. | 47898 | ඇලුමිනියම් මුට්ටිය |
| 04. | 48871 | ඇලුමිනියම් කලය |
| 05. | 49001 | යකඩ බැරලය |
| 06. | 47950 | යකඩ බැරලය<br>ගෑස් ලිප<br>ගෑස් සිලින්ඩරය |
| 07. | 49113 | ඇලුමිනියම් කලය |
| 08. | 45067 | තරාදි 01යි |
| 09. | 46736 | පතුල සිදුරු කළ බාල්දිය |
| 10. | 48402 | බාල්දි 02යි |
| 11. | 43841 | බාල්දි 01යි (යකඩ) |
| 12. | 47674 | යකඩ බැරලය<br>ගෑස් ලිප<br>ගෑස් සිලින්ඩරය |
| 13. | 47517 | යකඩ බැරලය |
| 14. | 47339 | ඇලුමිනියම් කලය |
| 15. | 47792 | යකඩ බැරල් 01 |
| 16. | 46940 | පිරිමි පාවහන් යුගලක් |
| 17. | 47337 | ඇලුමිනියම් මුට්ටිය<br>ඇලුමිනියම් කලය |
| 18. | 47569 | ඇලුමිනියම් කලය |
| 19. | 46941 | අව්කණ්නාඩි යුගලක් |
| 20. | 49105 | විදුලි පන්දමක් |
| 21. | 47516 | ඇලුමිනියම් මුට්ටි දෙකයි<br>ඇලුමිනියම් තැටිය |
| 22. | 50470 | තහඩු බාල්දි 01 |
| 23. | 50496 | ඇලුමිනියම් මුට්ටිය |
| 24. | 50471 | අඩිය සිදුරු කළ තහඩු බාල්දි 01 |
| 25. | 47451 | නිල්පාට බාග බැරල් එකයි |
| 26. | 47673 | ඇලුමිනියම් මුට්ටි 2<br>කුඩා බැරල් 01 |
| 27. | 48511 | යකඩ කලය |
| 28. | 50513 | නිල්පාට බැරල් එකයි |
| 29. | 48502 | ඇලුමිනියම් මුට්ටි 1 |
| 30. | 48586 | බැරල් 01 (කලු පාට) |
| 31. | 48378 | බැරල් 01 |
| 32. | 47461 | ප්ලාස්ටික් බැරල් 1 |
| 33. | 48179 | ප්ලාස්ටික් බැරල් 1 |
| 34. | 48174 | ප්ලාස්ටික් බැරල් 1 |
| 35. | 47801 | ඇලුමිනියම් මුට්ටි 1 |
| 36. | 47672 | ඇලුමිනියම් මුට්ටි 1 ලොකු |
| 37. | 47742 | ගෑස් ලිප් 1<br>කුඩා සෙල් ගෑස් සිලින්ඩර් 01 |
| 38. | 47896 | පතුල සිදුරු කර ඇති තහඩු බාල්දි එකයි |
| 39. | 43626 | යකඩ බාල්දි 01 |
| 40. | 43540 | සිදුරු කළ තහඩු පනිට්ටු 01 |
| 41. | 45965 | පනිට්ටු 01<br>උදලු 01 |
| 42. | 46158 | ලී ඉනිමග<br>යකඩ කූරු 4<br>ඉල්ලන් කූරු 01<br>ලී මිට සහිත උදළු 01<br>ලී මිට සහිත කුලු ගෙඩි 01<br>රබර් මිටි 01 යි. |
| 43. | 45962 | උදලු 01<br>යකඩ ඉනි 01<br>වජ් පිහි එකයි<br>විදුලි පන්දම |
| 44. | 48418 | යතුරු පැදි ආරක්ෂක හිස් වැසුම් 02 |
| 45. | 48416 | යතුරු පැදි ආරක්ෂක හිස් වැසුම් 02 |

**භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව ඉවත් කළ යුතු ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ ලැයිස්තුව**

| *අ.අ* | *භාණ්ඩයේ නම* | *තත්ත්වය/විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | ෆැක්ස් යන්ත්‍රය | Brother වර්ගයේ FAX - 236 මොඩලය හා සීරියල් අංක U 6154 GIK 292238 දරන ෆැක්ස් යන්ත්‍රය | 01 |
| 02. | පරිගණක යන්ත්‍ර | HP Compag වර්ගයේ පරිගනක යන්ත්‍රයක් හා CRT වර්ගයේ මොනිටරය | 01 |
| 03. | පරිගණක මුද්‍රණ යන්ත්‍ර | Brother වර්ගයේ HL - 5340 D මොඩලයක් සහිත මුද්‍රණ යන්ත්‍රය | 01 |
| 04. | මුදල් පරීක්ෂා කිරීමේ යන්ත්‍ර | Xinglong වර්ගයේ පැරණි තත්ත්වයේ පවතින මුදල් පරික්ෂා කිරීමේ යන්ත්‍රය | 01 |
| 05. | යතුරු ලියනය | Olympia වර්ගයේ සිංහල යතුරු පුවරුව සහිත යතුරු ලියන 03කි සීරියල් අංක<br>01. 7505546<br>02. 7505500<br>03. 7686703 | 03 |
| 06. | ඇඳි රහිත බංකු | කැබලි වශයෙන් වෙන් වෙන්ව පවතී | 01 |
| 07. | ඇඳි සහිත බංකු | කැබලි වශයෙන් වෙන් වෙන්ව පවතී | 02 |
| 08. | වතුර ෆිල්ටරය | Family වර්ගයේ ජල ෆිල්ටරය | 01 |
| 09. | විදුලි කේතලය | Wipro වර්ගයේ විදුලි කේතලය. | 01 |

05-121

---

**දැන්වීමයි**

මූතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2012.05.22

01. මූතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2021.05.22 වැනි දින පෙ. ව. 9.00ට මෙම අධිරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂාකර බැලිය හැකි වේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුවේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

*වෙන්දේසිය නියමිත භාණ්ඩ ප්‍රමාණය*

| | | |
|---|---|---|
| 1. | වැලි | 105 කියුබ් |
| 2. | පස් | 03 කියුබ් |

එච්. එම්. තස්නීම් ෆව්සාන්,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
මූතූර්.

05 - 207

---

**දැන්වීමයි**

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - බලන්ගොඩ**

අධිකරණය විසින් රාජසන්තක කරන ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

බලන්ගොඩ මහේසත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද සහ හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2021.05.22 වැනි දින පෙ. ව. 9.00ට පමණ මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (විස්තර සඳහා 2021.05.07 දින *ගැසට් පත්‍රය* බලන්න)

මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 8.00ට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

වෙන්දේසියේ දී මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් සිදුකළ යුතු ය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව තිබේ.

වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
බලංගොඩ.

2021 අප්‍රේල් මස 29 වැනි දින,
බලන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව - 2021**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ වර්ගය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | 52055, 82279, 40116, 82300, 40117, 52052, 82618, 82608, 66373, 81893, 77606, 63894, 82278, 50839, 57953, 66726 | උදලු | 25 |
| 02 | 40117, 66373, 81893, 83894, 50839, 66726 | ඉල්ලන් කුරු | 06 |
| 03 | 80074, 82073, 69960, 67786, 70252, 63102, 37901, 82709 | සවල් | 08 |
| 04 | 66726, 82300, 40117, 61267, 82615, 71262, 58953 | වේවැල් කුඩ | 17 |
| 05 | 40118, 61267, 61262, 63486, 50839, 37901, 59953, 66726 | ගැරුම් වට්ටි | 09 |
| 06 | 65479, 40117 | පොරව | 02 |
| 07 | 82437 | කළ | 01 |
| 08 | 65479 | ඇතිලි | 02 |
| 09 | 65479, 82724 | නැඹිලි | 03 |
| 10 | 65479 | ලොකු තාච්චි | 01 |
| 11 | 61267 | හෝස් බට | 02 |
| 12 | 82615, 66373, 61262, 82709, 31044, 60726 | ප්ලාස්ටික් බාල්දි | 08 |
| 13 | 82224 | ගෑස් සිලින්ඩරය සහ රෙගියුලේටරය සහිත ගෑස් ලිප ගෑස් සිලින්ඩරය (ලාෆ්)) | 01 |
| 14 | 78056 | ගෑස් සිලින්ඩරය (ලාෆ්) | 01 |
| 15 | 61267 | කහපාට විදුලි ජල මෝටර | 01 |
| 16 | 80724 | කොම්ප්‍රෙෂර් | 01 |
| 17 | 82724 | ඉලෙක්ට්‍රික් මෝටරය සහ කේබලය අඟල් 1/4 වට ප්‍රමාණයෙන් අඩි 100ක් දිග සුදු පැහැති බටය | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය |
|---|---|---|---|
| 18 | 82968 | ස්ටෑන්ඩ් එක සහිත ගෑස් ලිප් | 01 |
| 19 | 82153 | පැනසොනික් අධි ශීතකරණ | 01 |
| 20 | 82754 | ලොටරි හැමර් වර්ගයේ ගල් විදින උපකරණ | 01 |
| 21 | අංක රහිත | ප්ලාස්ටික් බැරල් තොගය | |
| 22 | අංක රහත | ප්ලාස්ටික් බූලි තොගය | |
| 23 | අංක රහිත | වීදුරු බෝතල් තොගය | |
| 24 | 53273 | එස්. ජී. පී. යූ. 3588 කැබ් රථය | 01 |
| 25 | 54717 | ත්‍රීරෝද රථය (කොටස් සඳහා) | 01 |
| 26 | 81947 | කැල්සයිඩ් ගල් | 500Kg |

05 - 219

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2021 මාර්තු මස 28 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඇන්ඩෘ ඇන්ඩ් වින්සන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 00237340
ලියාපදිංචි ලිපිනය : 97 ඒ, කඩවත පාර, දෙහිවල

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

ග්‍රෙගරීස් පාට්නර්ස්,
සමාගම් ලේකම්.

53/3, ග්‍රෙගරීස් පාර,
කොළඹ 07.

05-20

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කලින් කළුතර දකුණ, මැද මාවතේ, පලාතොට වත්තේ පදිංචිව සිටි, දැනට 12 සිළුන්නා කෝට් රොක්ස්බර්ග් පාර්ක් වික්ටෝරියා 3064 ඕස්ට්‍රේලියාව යන ලිපිනයේ පදිංචිව සිටින කමනි ඔසාකා කරුණාතිලක (ජාතික හැඳුනුම්පත් අංක 655970185 V) වන මා විසින්, ශ්‍රී ලංකාවේ කළුතර දකුණ ද අල්විස් පෙදෙස, අංක 9/1 හි පදිංචි පමිත විජය සමන්ත කරුණාතිලක (ජා.හැ. ප. අංක 640961090 V) යන අය වෙත ඔහු මාගේ සත්‍ය හා නෛතික ඇටර්නි බලකරු ලෙස පත්කරමින් ප්‍රදානය කරන ලද කලුතර ප්‍රසිද්ධ නොතාරිස් ආර් අජිත සී සමරසේකර විසින් ලියා සහතික කරන ලද අංක 3169 හා 2015.01.20 දතම දරන ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කොට අවලංගු කරන ලද බවත්, මින් ඉදිරියට එකී ඇටර්නි බලපත්‍රය කිසිඳු බලපැවැත්මක් හෝ බලයක් නීතිය ඉදිරියේ නොමැති බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

05-21/1

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කලින් කළුතර දකුණ, මැද මාවතේ, පලාතොට වත්තේ පදිංචිව සිටි, දැනට 12 සිළුන්නා කෝට් රොක්ස්බර්ග් පාර්ක් වික්ටෝරියා 3064 ඕස්ට්‍රේලියාව යන ලිපිනයේ පදිංචිව සිටින කමනි ඔසාකා කරුණාතිලක (ජාතික හැඳුනුම්පත් අංක 655970185 V) වන මා විසින්, ශ්‍රී ලංකාවේ කළුතර දකුණ, ද අල්විස් පෙදෙස, අංක 9/1 හි පදිංචි පමිත විජය සමන්ත කරුණාතිලක (ජා.හැ. ප. අංක 640961090 V) යන අය වෙත ඔහු මාගේ සත්‍ය හා නෛතික

ඇටර්නි බලකරු ලෙස පත්කරමින් ප්‍රදානය කරන ලද කලුතර ප්‍රසිද්ධ නොතාරිස් ආර් අජිත සී සමරසේකර විසින් ලියා සහතික කරන ලද අංක 3633 හා 2018.01.19 දතම දරන ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කොට අවලංගු කරන ලද බවත්, මින් ඉදිරියට එකී ඇටර්නි බලපත්‍රය කිසිදු බලපැවැත්මක් හෝ බලයක් නීතිය ඉදිරියේ නොමැති බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දනුම් දෙමි.

05-21/2

---

හෙට්ටිආරච්චිගේ චන්ද්‍රානි,
අංක 187/ටී/12,
''කරිටාස් විලේජ්'' වල්පොල, රාගම.

## ඇටෝර්නි බලපත්‍ර අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාගම, වල්පොල, ''කරිටාස් විලේජ්'' අංක 187/T/12 හි පදිංචි හෙට්ටිආරච්චිගේ චන්ද්‍රානි (ජා. හැ. අංකය 518513761 V) වන මම මෙයින් දනුම් දී සිටින වගයි.

කොළඹ දිස්ත්‍රික්කයේ, ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. ඒ. ප්‍රනාන්දු මහතා විසින් ලියා සහතික කරන ලද අංක 662 සහ වර්ෂ 1990.11.14 දිනැති විකුණුම්කරය මත දේපළේ වර්තමාන හිමිකරු මම වෙමි.

රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් දිලානි චන්ද්‍රිකා ප්‍රියදර්ශනී මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 1078 සහ වර්ෂ 2020.11.01 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මත කටයුතු කිරීම සඳහා ඇටෝර්නි බලකරු වශයෙන් සඳහන්ව ඕපනායක, විද්‍යාල මාවත, අංක 39/ඒ/1 හි පදිංචි කංකානමගේ දෙන් ප්‍රියංකර සංජීව කුමාරතුංග (ජා. හැ. අංකය 197212900743) යන අය පත්ව ඇති අතර, ඔහු වෙත පවරා ඇති එකී ඇටෝර්නි බලය වර්ෂ 2021.04.07 වැනි දින සිට බලාත්මක වන පරිදි එම විශේෂ ඇටෝර්නි බලපත්‍රය මත වූ සියලුම බලතල අහෝසි කරන බවත්, මෙතැන් පටන් ඔහු තවදුරටත් මාගේ ඇටෝර්නි බලකරු නොවන බව් මෙයින් දන්වා සිටිනු ලැබේ.

මෙම විශේෂ ඇටෝර්නි බලපත්‍රය සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්, ඌව සබරගමුව කලාප කාර්යාලය, රත්නපුර කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 27 වන කාණ්ඩයේ 141 වන පත්‍රිරුවේ දින පොත් අංක 1109 යටතේ ලියාපදිංචි කොට ඇති බවත් වැඩිදුරටත් දන්වමි.

හෙට්ටිආරච්චිගේ චන්ද්‍රානි,
ඇටෝර්නි අධිපති.

05-22

## ලියාපදිංචි කිරීමේ දන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි නියමිත පරිදි පහත සඳහන් සමාගම ලියාපදිංචි කර ඇති බවට දනුම් දෙන ලදී.

සමාගමේ නම : වෙබ් ඇප්ක්ලවුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 00236022
ලියාපදිංචි ලිපිනය : අංක 20, ස්වර්ණ පෙදෙස, නාවල පාර, රාජගිරිය, තැපැල් කේතය 10100

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බී. පී. ටී. පීරිස්,
ලේකම්.

05-24

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුව පහත සමාගම් ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඉමෙට් හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලිපිනය : 18, වලගම්බා මාවත, බොරුපන පාර, රත්මලාන
ලියාපදිංචි අංකය : පීවී 00223795
ලියාපදිංචි දිනය : 2020.07.05

සමාගමේ නම : ඇවිඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලිපිනය : 117/2/123, ප්‍රයිම් අර්බන් ආර්ට්, හොරහේන පාර, කොට්ටාව
ලියාපදිංචි අංකය : පීවී 00223794
ලියාපදිංචි දිනය : 2020.07.05

සමාගමේ නම : ඒඩ්‍රිලානෝ (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලිපිනය : 27/6, දෙවෙනි පටුමග, දේවාල පාර, දෙපානම, පන්නිපිටිය
ලියාපදිංචි අංකය : පීවී 00229595
ලියාපදිංචි දිනය : 2020.10.25

සමාගමේ නම : ගම්මන්පිල ඔසු (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලිපිනය : 11/B, පළමු මහල, කොළඹ හොරණ පාර, වෑතර
ලියාපදිංචි අංකය : පීවී 00228445
ලියාපදිංචි දිනය : 2020.10.02

සමාගමේ නම : අයි ඇන්ඩ් සී සෑන්ඩ් ට්‍රේඩිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලිපිනය : 05, කැනෝන් ජේකබ් මෙන්ඩිස් මාවත, ඉඩම, මොරටුව
ලියාපදිංචි අංකය : පීවී 00236448
ලියාපදිංචි දිනය : 2021.03.13

සමාගමේ නම : කාඩෝ ඔටෝ ස්පාර්ක්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලිපිනය : 2E, ජයසිංහ වත්ත, වැල්මිල්ල හංදිය, බණ්ඩාරගම
ලියාපදිංචි අංකය : පීවී 00236133
ලියාපදිංචි දිනය : 2021.03.08

සමාගමේ නම : කැන්ගරූ ඉන්ටර්නැෂනල් ගෲප් ඔෆ් කම්පැනීස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලිපිනය : 26 B, පල්ලිදෙර පාර, දෙහිවල
ලියාපදිංචි අංකය : පීවී 00236255
ලියාපදිංචි දිනය : 2021.03.10

සමාගමේ නම : ආර් ටෙක් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලිපිනය : 38/1, ශ්‍රී දේවානන්ද මාවත, පිළියන්දල
ලියාපදිංචි අංකය : පීවී 00237652
ලියාපදිංචි දිනය : 2021.04.04

කීමැනේජ්මන්ට් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-43

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 131/05, බුත්ගමුව පාර, රාජගිරිය ලිපිනය සහ, වර්තමානයේ ජුලියස්වොස්ලර්, එස් ටී ආර්. 112.22527, හැම්බර්ග්, ජර්මනියේ පදිංචි, මහේෂාන් කුගන්, සතාසිවම් මහේෂාන් ගේ වැන්දඹු බිරිඳ වන ආනන්ත මහේස්වරී දෙපළ වන අප ප්‍රධාන පාර, කන්දවලෙයි, කිලිනොච්චි යන ලිපිනයේ සිටින ජාතික හැඳුනුම්පත් අංක 642382250V දරන සින්නයියා තවපලන් යන අය ෂන්මුගලිංගම් සිවරුබන් යන නොතාරිස් තැන සාක්ෂි ලෙස පෙනී සිටිමින් 2013.01.20 යන දින විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ භාරකරු ලෙස පත්කළෙමු. එය, යාපනය ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කෙරිණ.

අපගේ පුද්ගලික කරුණු මත, මෙම විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන අතර 2021.01.01 දින සිට සින්නයියා තවපලන් යන අය වෙත විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ භාරකාරත්වය අහිමි වන බවත්, මෙම විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් බලතල අහිමි වන බවත් මෙයින් තහවුරු කර සිටිමු.

මහේෂාන් කුගන් සහ සතාසිවම් මහේෂාන් ගේ වැන්දඹු බිරිඳ වන ආනන්ත මහේස්වරී.

05-47

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වනු ලැබේ.

සමාගමේ නම : ඩියුප්රා ඊ-සොලූෂන්ස් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
ලියාපදිංචි අංකය : පීවී 00237040
ලියාපදිංචි කළ දිනය : 2021.03.22
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 200, තෙලවල පාර, ගල්කිස්ස.

05-79/1

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වනු ලැබේ.

සමාගමේ නම : දිමෙත් ෆුඩ් එක්ස්පෝර්ට්ස් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
ලියාපදිංචි අංකය : පීවී 00236920
ලියාපදිංචි කළ දිනය : 2021.03.21
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 200, තෙලවල පාර, ගල්කිස්ස.

05-79/2

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

සියලු දෙනාම මෙයින් දැනගත යුතු ය. අංක බී/337, හපුගස්තලාව, නාවලපිටිය යන ලිපිනයේ පදිංචි රාවුෆ් මොහොමඩ් හිල්මී (ජා. හැ. අංක 693411580 V) වන මා විසින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් අංක 165, අඹගමුව පාර, නාවලපිටිය යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක හිමි බන්නක්ගෙදර සරත් කුමාර (ජා. හැ. අංක 620593818 V) වෙත ලබාදෙන ලද නාවලපිටිය ප්‍රසිද්ධ නොතාරිස් විරාජනී ගෝමස් මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 661 සහ වර්ෂ 2016.10.11 දිනැති ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2021.04.19 දින පටන් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන අතර, 2021.04.19 දින සිට එකී ඇටර්නි බලපත්‍රය සම්බන්ධයෙන් ඉහත කී ඇටර්නි බලකරු විසින් සිදු කරනු ලබන කිසිදු ගනුදෙනුවක් සම්බන්ධව මා වගනොකියනු ලබන බව මෙයින් ශ්‍රී ලංකා ජනරජය වෙත දන්වා සිටිමි.

රාවුෆ් මොහොමඩ් හිල්මී.

05-112

---

## ඇටොර්නි බලපත්‍රය අවලංගු කිරීම

කෝවිල් පාර, වීරමුන 04, සම්මන්තුරෙයි මුත්තුලිංගම් සිවගුරු වන මා ශ්‍රී ලංකා ජනරජයේ රජයටත් එහි මහජනතාවටත් මෙයින් දන්වා සිටින්නේ අංක 26, එල්ලෙයි වීදිය, කල්මුනේ - 01 යන ලිපිනයේ පදිංචි විනායගමූර්ති පුවනේස්වරන් යන අයට මා විසින් ලබාදෙන ලද 2015.06.01 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් එම්. ගුණසේකරම් යන අය විසින් අංක 12188 සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය ඇටෝර්නි බලයේ වගන්ති (04) ප්‍රකාරව (බලය 140) හි යටතේ මෙයින් අවලංගු කර අහෝසි කරන්නෙමි.

මුත්තුලිංගම් සිවගුරු.

05- 167

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ජාතික සංවර්ධන බැංකුව පී එල් සී (අවිස්සාවේල්ල ශාඛාව)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 09 වෙනි වගන්තිය යටතේ අවිස්සාවේල්ලේ පිහිටි ''වෙලිමන්නාව ඕවිට'' ලෙස හඳුන්වන ලබන වටිනා වෙළෙඳ වටිනාකමකින් යුතු දේපළ භූමිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර ඇතුළුගම කෝරළේ දෙහිඕවිට ප්‍රාදේශීය සභා මායිමෙහි ඇපල් පිටිය ග්‍රාම නිලධාරි වසමේ ගුරුගල්ලේ හි පිහිටි ''වැලිමැන්නාව ඕවිට'' ලෙස හඳුන්වන, බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. කුමාර විසින් 2012 මාර්තු මස 13 වැනි දින සමීක්ෂණය කරන ලද අංක 4525 පිඹුරුතෙහි ලොට් අංක 05 ලෙස සඳහන් සීමා නිර්ණය කොට බෙද වෙන් කරන ලද,

| | | |
|---|---|---|
| උතුරු දිශාවෙන් | : | එම පිඹුරු පතෙහිම ලොට් අංක 4 දරන ඉඩමෙන් ද, |
| නැගෙනහිර දිශාවෙන් | : | මාර්ගයෙන් ද, |
| දකුණු දිශාවෙන් | : | කොටුවේ වත්තෙන් ද, |
| බටහිර දිශාවෙන් | : | කැළණි ගංගාවෙන් ද. |

අවිස්සාවේල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව C22/41 හි ලියාපදිංචි කර ඇති රූඩ් එකයි පර්චස් දහනවයක (අ. 0, රූ. 1, පර්. 19) වපසරියක් පුරා පැතිර ඇති ඉඩම සහ එහි දැනට පවත්නා හෝ මෙතැන් සිට වරින් වර සවිකල හැකි නිශ්චල කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ ආයිත්තම් සවිකිරීම්, සේවාවන් සියල්ල ද, විදුලි සැපයුම් පද්ධතිය සහ උපකරණ, ජලය සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායු සමීකරණ උපකරණ ඇතුලු සෑම දෙයක් සමගම.

අවිස්සාවේල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. වයි. ඉන්දිකා රාජපක්ෂ නොතාරිස් මහත්මිය හමුවේ දිවුරුම් දුන් පරිදි 2018 පෙබරවාරි මස 15 දිනැති අංක 87 දරන බැඳුම්කරය කුරුප්පුගේ සුසන්ත ජයසේන යන බන්ධනදායකයා වෙත ලබාදුන් පහසුකම් සඳහා සුරක්ෂිත දේපළ වෙනුවෙන් ජාතික සංවර්ධන බැංකුව පී එල් සී වෙත පොරොන්දු වූ ගෙවීම් පැහැර හැර ඇත.

ජාතික සංවර්ධන බැංකුව පී එල් සී විසින් මා හට පවරන ලද බලය යටතේ ඉහත සඳහන් කළ දේපළ 2021 මැයි මස 31 වන සඳුදා දින පෙරවරු 10.30 ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණනු ලබන බව දැනුම් දෙමු.

*දේපළ සඳහා වූ ප්‍රවේශය. -*

අවිස්සාවේල්ල නගර මධ්‍යයේ සිට යටියන්තොට මාර්ගය ඔස්සේ කිලෝමීටර් 1.5ක් පමණ පැමිණ වම් දිශාවෙන් ඇති අම්තිරිගල මාර්ගයේ සිට කිලෝමීටර් 4.3ක් පැමිණ වමතට හැරී එතැන් සිට බ්ලූමින්ග් හොලිඩේ රිසෝර්ට් දක්වා දිවෙන මාර්ගයේ පාලම හමුවීමට ප්‍රථම මීටර් 35ක් පමණ ඉදිරියට පැමිණි පසු එම මාර්ගයේ දකුණු දිශාවෙන් ඉහත සඳහන් දේපළ පිහිටා ඇති අතර පොදු නෛතික යතුරුපැදි ප්‍රවේශයක් පැහැදිලිවම ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් මිටිය පහත හෙළීමත් සමගම පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. ගැනුම් මිල මත වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) මිලදී ගත් මිල සහ කොමිස් සඳහා අදාළ බදු,
4. ලිපිකරුගේ සහ සෝෂක සඳහා රු. 1,000ක් වූ ගාස්තුව,
5. විකුණුම් පිරිවැය සහ අනෙකුත් සියලුම ගාස්තු තිබේ නම්,
6. විකුණුම් තත්ත්වය සඳහා රුපියල් 2000 ක නොතාරිස් ගාස්තුව.

මිලදී ගත් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල සහ වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, බදු හෝ ශ්‍රී ලංකා රජය හෝ වෙනත් අධිකාරියක් විසින් පනවන ලද ගාස්තු විකුණනු ලැබූ දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පුව සහ අනෙකුත් අදාළ ලියකියවිලි පහත ලිපිනයෙන් ලබා ගත හැකි ය :

කළමනාකරු - සිල්ලර අයකර ගැනීම්, ජාතික සංවර්ධන බැංකුව පී. එල්. සී., අංක 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක 011 - 2448448/ෆැක්ස් අංකය : 011- 2440262.

* පූර්ව දැනුම් දීමකින් තොරව ඉහත වෙන්දේසි විකිණීම වලංගු කිරීමට/අවලංගු කිරීමට බැංකුවට අයිතියක් ඇත.

* COVID 19 ප්‍රොටෝකෝලය පිළිපැදීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව වෙන්දේසිය පවත්වනු ලැබේ.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 146/3, කල්දේරා උද්‍යානය,
පහළ දුටුගැමුණු වීදිය,
කොහුවල.
දුරකථන අංක : 011- 4367467, 011 - 4367111
aucslk@gmail.com

05-76

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 09 වෙනි වගන්තිය ප්‍රකාරව පනාගොඩ ''මුඩක්කුවේකැලේ'' ලෙස නම් කර ඇති වටිනා දේපළක් සහ එහි ඇති ගස්, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර ඇතුළු සියල්ල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ හෝමාගම දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ පනාගොඩ බස්නාහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංක 482 දරන ''මුඩක්කුවේකැලේ'' නමැති දේපල සඳහා අවසරලත් මිනින්දෝරු ආර්. ඒ. සිරිසේන මහතා විසින් 2012 මාර්තු මස 13 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 2323 ලොට් අංක A දරන ප්‍රමාණයෙන් පර්චස් 36.7 (අක්. 0, රූඩ් 0, පර්. 36.7) වූ හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රියේ ෆෝලියෝ ඒ 230/88 වෙලුමේ ලියාපදිංචි කර ඇති ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි ආදී සෑම සියලු දේ ද සමග වේ.

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. නදීකා ශාමලී කුමාරි රත්නායක හමුවේ දිවුරුම් දුන් පරිදි 2016 ජූලි 28 දිනැති අංක 483 දරන උකස් බැඳුම්කරය, බැඳීම ඇති ශානි ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් ප්‍රයිවට් ලිමිටඩ් මාතරගේ ඩොන් චන්දන කුමාර කරුණාරත්න (ශානි ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් ප්‍රයිවට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ) බන්ධනදයකයා පොරොන්දු වූ පරිදි ගෙවීම් පැහැර හැර ඇත.

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් මා හට පවරන ලද බලය යටතේ ඉහත සඳහන් කළ දේපළ 2021 පෙබරවාරි මස 24 වැනි බදාදා දින පෙරවරු 12.30 ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණෙනු ලබන බව දනුම් දෙමු.

*දේපළ සඳහා වූ ප්‍රවේශය.* - හෝමාගම නගරයේ සිට හයි ලෙවල් මාර්ගය ඔස්සේ පනාගොඩ හමුදා කඳවුර පසු කර අවිස්සාවේල්ල දෙසට කිලෝමීටර් 02ක් පමණ පැමිණ වම් පස ඇති අඩි 20ක් පළල පාරට හැරෙන්න. මෙය ලංකා ටයිල් ප්‍රදර්ශනාගාරය ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පිහිටි පෞද්ගලික බොරළු මාර්ගයකි. අංක 2323 දරන සමීක්ෂණ සැලැස්මේ පෙන්වා ඇති පරිදි විෂය දේපල වෙත ළඟා වීමට මීටර් 50ක් පමණ දුරක් මෙම මාර්ගය ඔස්සේ ඉදිරියට යන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් මිටිය පහත හෙළීමත් සමගම පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) සහ කොමිස් මුදල මත අදාළ බදු,
4. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 1,000,
5. විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු (තිබේනම්),
6. විකිණීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු ය.

වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න. නීති දෙපාර්තමේන්තුව, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 02.

පූර්ව දනුම් දීමක් නොකර ඉහත වෙන්දේසි අලෙවිය අවලංගු කිරීමට/අවලංගු කිරීමට බැංකුවට අයිතියක් බැංකුව සතු ය.

COVID 19 වැලැක්වීම සඳහා වූ සෞඛ්‍යය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව වෙන්දේසිය පවත්වනු ලැබේ.

ඩලස් කෙලාව්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 146/3, කල්දේරා උද්‍යානය,
පහළ දුටුගැමුණු වීදිය,
කොහුවල.
දුරකථන අංක : 011- 4367467, 011 - 4367111
aucslk@gmail.com

05-77

---

**සීමාසහිත එම්. සී. බී. බැංකුව - ගාල්ල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ වන විකුණුම් නිවේදනය

**වටිනා වෙළඳ වටිනාකමකින් යුතු දේපළ භූමිය, එහි ඇති ගස්, පළතුරු වගාවන් තුළ සියල්ල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

***ඉහත සඳහන් දෙවන උපලේඛනය***

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරන්දෙණිය කොට්ඨාස ලේකම් කොට්ඨාසයේ අංක 93 ''කුරුඳුගහ හැතැප්ම'' නිලධාරි වසමේ ''අස්සලුකන්ද අද්දර ඔිවිට'' ලෙස හඳුන්වන බලයලත් මිනින්දෝරු ඩී. ජී. මෙන්ඩිස් විසින් සමීක්ෂණය කරන ලද අංක 893 E පිඹුරුපතෙහි ලොට් අංක A2B ලෙස සඳහන් සීමා නිර්ණය කොට බෙද වෙන් කරන ලද,

උතුරු දිශාවෙන් : අංක 893 පිඹුරුපතෙහි ලොට් අංක A2C ද, නැගෙනහිර දිශාවෙන් එම අංක 893 E පිඹුර ප්‍රකාර අඩි 12ක් පළල පාරෙන්ද, දකුණු දිශාවෙන් අංක 893 E පිඹුර ප්‍රකාර ලොට්

අංක A2A මගින් ද, බටහිර දිශාවෙන් අස්සලු කන්ද කුඹුරු යායෙන් ද, පර්චස් 08 ක (අ. 0, රූ. 0, පර්. 08) වපසරියක් පුරා පැතිර ඇති ඇල්පිටිය හි ඉඩම් ලේඛනයේ වෙළුම/ෆෝලියෝ J 70/115 හි ලියාපදිංචි කර ඇති ඉඩම හා එහි අඩංගු ගොඩනැගිලි සහ ගස්, පලතුරු වගා සහ එහි ඇති සෑම දෙයක් සමගම.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඉසෙඩ්. හුස්නේමියා හමුවේ දිවුරුම් දුන් පරිදි 2017 අගෝස්තු 23 දිනැති අංක 466 දරන බැදුම්කරය සහ 2018 ජූලි 24 දිනැති අංක 540 දරන බැදුම්කරය ''එම්/එස් ගීනුලී සිනමන් '' යන නාමය යටතේ ඒක පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන මුනිගොඩ හකුරු චමල් පුෂ්පිකා යන බන්ධනදායකයා වෙත ලබාදුන් පහසුකම් සඳහා සුරක්ෂිත දේපල වෙනුවෙන් සීමාසහිත එම් සී බී බැංකුව වෙත පොරොන්දු වූ ගෙවීම් පැහැර හැර ඇත.

සීමාසහිත එම් සී බී බැංකුව විසින් මා හට පවරන ලද බලය යටතේ ඉහත සඳහන් කළ දේපළ 2021 මැයි මස 24 වන සඳුදා දින පෙරවරු 11.00 ට ඉඩම පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණෙනු ලබන බව දැනුම් දෙමු.

*දේපළ සඳහා වූ ප්‍රවේශය.* - දකුණු අධිවේගී මාර්ගයේ කුරුඳුගහ හැතැක්ම පිටවීමේ සිට අම්බලන්ගොඩ ඇල්පිටිය මාර්ගය ඔස්සේ ඇල්පිටිය දෙසට මීටර් 100 සිට 150 දක්වා පැමිණ එල්. එම්. පී. මාවත හෝ ලංකා ඉන්ධන පිරවුම් හල පසුවනවාත් සමග වම් අත දෙසට ඇති පීරිස් මාවත වෙත පිවිසෙන්න. එතැන් සිට එම මාර්ගයේ මීටර් 150 සිට 200 දක්වා ගමන් කර මාර්ග වෙන් කිරීම වෙත පැමිණ එතැන සිට තවත් මීටර් 100 සිට 125 දක්වා ගමන් කර මංසන්ධිය වෙත පැමිණෙන්න. ඉන්පසු වමතට හැරී කෙටි දුරක් ගමන් කළ පසු දකුණු දිශාවෙන් ඉහත කී දේපළ පිහිටයි. එය මෙම මාර්ගය වෙන් කළ ස්ථානයේ කෙළවරෙහි පිහිටා ඇත.

විකිණීමේ නිවේදනය සඳහා කරුණාකර 2021 පෙබරවාරි මස 12 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2021 පෙබරවාරි 13 වැනි දින ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් පරිහරණය කරන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් මිටිය පහත හෙළීමත් සමගම පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) සහ කොමිස් මුදල මත අදාළ බදු,
4. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 1,000,
5. විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු (තිබේනම්),
6. විකිණීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙනත් ඒවාද වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදාල ලියකියවිලි පහත ලිපිනයෙන් ලබා ගත හැකි ය. ණය පරිපාලන දෙපාර්තමේන්තුව, සීමාසහිත එම් සී බී බැංකුව, අංක 08, යෝක් ආකේඩ් ගොඩනැගිල්ල, ලේඩන් බැස්ටියන් පාර, කොළඹ 01,
දුරකථන අංකය : + 94115222200

පූර්ව දැනුම් දීමක් නොකර ඉහත වෙන්දේසි අලෙවිය අවලංගු කිරීමට /අවලංගු කිරීමට බැංකුවට අයිතියක් බැංකුව සතු ය.

COVID 19 වැළැක්වීම සඳහා වූ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව වෙන්දේසිය පවත්වනු ලැබේ.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 146/3, කල්දේරා උද්‍යානය,
පහළ දුටුගැමුණු වීදිය,
කොහුවල.

දුරකථන අංකය : 011- 4367467, 011- 4367111
aucslk@gmail.com

05-75

---

**සීමාසහිත එම්. සී. බී. බැංකුව - ගාල්ල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ වන විකුණුම් නිවේදනය

**වටිනා වෙළඳ වටිනාකමකින් යුතු දේපළ භූමිය, එහි ඇති ගස්, පළතුරු වගාවන් ඇතුළු සියල්ල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

ඉහත සඳහන් පළමු උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරන්දෙණිය කොට්ඨාස ලේකම් කොට්ඨාසයේ අංක 93C ''කුරුඳුගහ හැතැප්ම'' ග්‍රාම නිලධාරි වසමේ ''අස්සලුකන්ද අද්දර'' ලෙස හඳුන්වන බලයලත් මිනින්දෝරු මාදුවගේ තේජසිලී සමීක්ෂණය කරන ලද අංක 1089 B පිඹුරුපතෙහි ලොට් අංක B1 ලෙස සඳහන් සීමා නිර්ණය කොට බෙද වෙන් කරන ලද,

උතුරු දිශාවෙන් : ඇලකින් ද, නැගෙනහිර දිශාවෙන් : අස්සලුකන්ද අද්දර ඕවිටෙන් ද, දකුණු දිශාවෙන් : පාරෙන් ද, බටහිර දිශාවෙන් : ඇලකින් ද, පර්චස් 11 ක (අ. 0, රූ. 0,

පර්. 11) වපසරියක් පුරා පැතිර ඇති ඇල්පිටිය හි ඉඩම් ලේඛනයේ වෙළුම/ෆෝලියෝ ජේ. 23/116 හි ලියාපදිංචි කර ඇති ඉඩම හා එහි අඩංගු ගොඩනැගිලි සහ ගස්, පලතුරු වගා සහ එහි ඇති සෑම දෙයක් සමගම.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඉසෙඩ්. හුස්නේමියා හමුවේ දිවුරුම් දුන් පරිදි 2017 අගෝස්තු 23 දිනැති අංක 466 දරන බැඳුම්කරය සහ 2018 ජූලි 24 දිනැති අංක 540 දරන බැඳුම්කරය ''එම්/එස් ගීනුලී සිනමන් '' යන නාමය යටතේ ඒක පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන මුනිගොඩ හකුරු වමල් පුෂ්පිකා යන බන්ධනදායකයා වෙත ලබාදුන් පහසුකම් සඳහා සුරක්ෂිත දේපළ වෙනුවෙන් සීමාසහිත එම් සී බී බැංකුව වෙත පොරොන්දු වූ ගෙවීම් පැහැර හැර ඇත.

සීමාසහිත එම් සී බී බැංකුව විසින් මා හට පවරන ලද බලය යටතේ ඉහත සඳහන් කළ දේපළ 2021 මැයි මස 24 වැනි සඳුදා දින පෙරවරු 10.30 ට ඉඩම පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණනු ලබන බව දැනුම් දෙමු.

*දේපළ සඳහා වූ ප්‍රවේශය.* - දකුණු අධිවේගී මාර්ගයේ කුරුදුගහ පිටවීමෙන් පැමිණ කුරුඳුගහ නගරය වෙත දිවෙන ඇල්පිටිය මාර්ගය ඔස්සේ මීටර් 150ක් පමණ පැමිණ වම් දිශාවට හැරී එතැන් සිට එල්. එම්. පී. මාවත ඔස්සේ මීටර් 150 ක් පැමිණ ඉන් අනතුරුව වම් දිශාවට ඇති පළල අඩි 12ක් වන මාර්ගයේ මීටර් කිහිපයක් පැමිණි විට ඉහත සඳහන් දේපළ දකුණු දිශාවෙන් පිහිටයි.

විකිණීමේ නිවේදනය සඳහා කරුණාකර 2021 පෙබරවාරි මස 12 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2021 පෙබරවාරි 13 වැනි දින ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් පරිහරණය කරන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් මිටිය පහත හෙලීමත් සමගම පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) සහ කොමිස් මුදල මත අදළ බදු,
4. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 1,000,
5. විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු (තිබේ නම්),
6. විකිණීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පුව සහ අනෙකුත් අදාල ලියකියවිලි පහත ලිපිනයෙන් ලබා ගත හැකි ය. ණය පරිපාලන දෙපාර්තමේන්තුව, සීමාසහිත එම් සී බී බැංකුව අංක 08, යෝක් ආකේඩ් ගොඩනැගිල්ල, ලේඩන් බැස්ටියන් පාර, කොළඹ 01,

දුරකථන අංක : 94 115222200

පූර්ව දැනුම් දීමක් නොකර ඉහත වෙන්දේසි අලෙවිය අවලංගු කිරීමට /අවලංගු කිරීමට බැංකුවට අයිතියක් බැංකුව සතු ය.

COVID 19 වැලැක්වීම සඳහා වූ සෞඛ්‍යය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව වෙන්දේසිය පවත්වනු ලැබේ.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 146/3, කල්දේරා උද්‍යානය,
පහළ දුටුගැමුණු වීදිය,
කොහුවල.

දුරකථන අංක : 011- 4367467, 011- 4367111
aucslk@gmail.com

05-74

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ 2021 ක් වූ මැයි මස 25 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. බස්නාහිර පළාතේ, (මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කෝවින්න අංක 151 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කෝවින්න ගම පිහිටි ''තේක්කවතු කැබැල්ල'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් මැන සාදන ලද වර්ෂ 2015.12.04 වැනි දිනැති අංක 6961 දරන පිඹුරේ කැබලි අංක 5 (ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. සෙනෙවිරත්න විසින් මැන සාදන ලද වර්ෂ 2008.03.10 වැනි දිනැති අංක 37 දරන තැගි ඔප්පුවේ සඳහන් වන ''තේක්කවතු කැබැල්ල'' නමැති ඉඩමේ නැවත මැනුමක් හා අනුබෙදීමක් වේ)
විශාලත්වය : (අක්. 0, රූ. 01, පර්. 30)

2. බස්නාහිර පළාතේ, (මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාසය තුළ, කෝවින්න අංක 151 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කෝවින්න ගම පිහිටි ''තේක්කවතු කැබැල්ල'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් මැන සාදන ලද වර්ෂ 2015.12.04 වැනි දිනැති අංක 6961 දරන පිඹුරේ කැබලි අංක 2 (ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. සෙනෙවිරත්න විසින් මැන සාදන ලද වර්ෂ 2008.03.10 වැනි දිනැති අංක 37 දරන තැගි ඔප්පුවේ සඳහන් වන ''තේක්කවතු කැබැල්ල'' නමැති ඉඩමේ නැවත මැනුමක් හා අනුබෙදීමක් වේ)

විශාලත්වය : (අක්. 0, රූ. 01, පර්. 35.80)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. ඒ. දයානන්ද විසින් සහතික කරන ලද වර්ෂ 2016.08.12 වැනි දිනැති අංක 298 සහ 300 උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම එයාර්පෝට් සිටි හබ් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ''බන්ධනදායි/උකස්කරු'' ලෙස ද සහ උපුල් චමින්ද පෙරේරා කුමාරසිංහ (බන්ධනදායි සමාගමෙහි අධ්‍යක්ෂක) යන අය ''උකස්කරු'' ලෙස ද පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2018.06.01 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය*ද, වර්ෂ 2018.05.18 දිවයින, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය*.- කොළඹ සිට මීගමුව මාර්ගයේ කි. මී. 24ක් කටුනායක දක්වා ගොස් දකුණට ඇති කටුනායක මිනුවන්ගොඩ පාරට හැරී කි. මී. 5ක් පමණ යන විට දකුණට ඇති ගංගාරාම පාරේ නැවත මීටර් 500ක් ගිය විට සිටිහබ් හෝටලයට යාමට ඇති මාර්ගයට පෙර ඇති මාර්ගයෙන් දකුණට හැරී මීටර් 200 ක් යන විට එම මාර්ගය අවසානයේ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* : වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු.500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු - නීති, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4667227/011-4667220.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 071-8446374, 0777761706
ෆැක්ස් : 08112210595.

05-69

---

### ලංකා බැංකුව

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීමයි**

කොළඹ 01, ජනාධිපති මාවතේ, අංක 69 හි සෙලින්කෝ හවුස් නැගෙනහිර කොටසෙහි 10 වන මහලෙහි එන්ට්‍රස්ට් සිකියුරිටීස් පී. එල්. සී. හි ණය වගකීම් වෙනුවෙන් කොළඹ 03, අබ්දුල් ගෆූර් මාවතේ වරිපනම් අංක 06 හි පිහිටි උකස් කරන ලද දේපළ.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019 නොවැම්බර් මස 08 දිනැති අංක 2149 දරන *ගැසට් පත්‍රයේ* හා 2019 ඔක්තෝබර් මස 25 වැනි දින ''දිනමිණ'' ''ඩේලිනිව්ස්'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2021 ජුනි 04 වැනි දින පෙ. ව. 10.00 ට කොලොන්නාව විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් වෙන්දේසිකාර සමාගමේ එම්. එච්. තුසිත කරුණාරත්න මහතා විසින් වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 8 (කොල්ලුපිටිය) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ කොළඹ මහ නගර සභා සීමාවේ

කොල්ලුපිටිය පෙන්ඩෙනිස් ඇවනියුහි (දැනට් අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) පිහිටි ''මිලිසෙන්ට් කොටේජ්'' යැයි කියනු ලබන සහ එනමින් ප්‍රසිද්ධ කලින් වරිපනම් අංක $60^{K2}$ දරන (පසුව වරිපනම් අංක 08 දරන) සීමා විස්තර කොට නිරූපනය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : පටුමගක් ද, නැගෙනහිරට : එච්. දෙන් කරෝලිස් සහ පුත්‍රයන්ට අයිති පෙන්ඩෙනිස් ලෙස ප්‍රසිද්ධ පරිශ්‍රය ද, දකුණට : සී. ඩබ්. ලෙවිස් පෙරේරා ට අයිති ''කිලර්නි'' ලෙස ප්‍රසිද්ධ පරිශ්‍රය ද, බස්නාහිරට ''බ්ලෙන්හිම්'' ලෙස ප්‍රසිද්ධ වරිපනම් අංක $60^{K1}$ දරන පරිශ්‍රය ද මායිම්ව බලයලත් මිනින්දෝරු එච්. සී. ඩයස් විසින් සාදන ලද 1915.05.01 දිනැති අංක 1705 දරන මැනුමෙහි සහ එහි විස්තරයට අනුව පර්චස් දහතක් සහ පර්චසයකින් දහසෙන් තුන්සිය හැත්තෑපහක පංගුවක (අ. 0, රූ. 0, පර්. 17 375/1000) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියළු දේ සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1003/238 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු වී. කාර්තිගේසු විසින් පසුව සාදන ලද 1946.02.08 දිනැති අංක 518 දරන මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවේ. කොල්ලුපිටිය පෙන්ඩෙනිස් ඇවනියුහි (දැන් අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) පිහිටි ''මිලිසෙන්ට් කොටේජ් '' නමැති කලින් වරිපනම් අංක $60^{K2}$ දරන (පසුව වරිපනම් අංක 08 දරන) සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : පෙන්ඩෙනිස් ඇවනියු ද (දැන් අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ ) නැගෙනහිරට පෙන්ඩෙනිස් ඇවනියු හි (දැන් අබ්දුල් ගෆූර් මාවත ලෙස ප්‍රසිද්ධ) දැන් වරිපනම් අංක 10 දරන පරිශ්‍රයද, දකුණට ගාලු පාරේ දැන් වරිපනම් අංක 295 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : ගාලු පාරේ දැන් වරිපනම් අංක 293 දරන පරිශ්‍රය ද, මායිම්ව පර්චස් දහතයි දශම තුනයි හතයි පහක (අ. 0, රූ. 0 පර්. 17.375) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1003/238 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජේ. වීරසිංහ විසින් මෑතකදී සාදන ලද 2008.05.28 දිනැති අංක 3802 දරන මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී කොල්ලුපිටියෙහි පිහිටි අබ්දුල් ගෆූර් මාවතේ වරිපනම් අංක 06 දරන, අංක 3802 දරන එකී පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම කැබැල්ල උතුරට : අබ්දුල් ගෆූර් මාවත ද, නැගෙනහිරට : අබ්දුල් ගෆූර් මාවතේ වරිපනම් අංක 10A දරන පරිශ්‍රය ද, දකුණට : ගාලු පාරේ වරිපනම් අංක 295 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : ගාලු පාරේ වරිපනම් අංක 293 දරන පරිශ්‍රය ද, මායිම්ව පර්චස් දහතයි දශම දෙකයි නවයක (අ. 0, රූ. 0, පර්. 17.29) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියළු දේ සමඟ වේ.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන කළමනාකරු,
(ආයතනික අයකරගැනීම්).

ලංකා බැංකුව,
ආයතනික අයකර ගැනීම් අංශය,
3 වන මහල, ලංකා බැංකු චතුරශ්‍රය,
අංක 01, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

05 - 01

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

බී. එම්. ආර්. කේ. හේරත්.
ගිණුම් අංක : 0109 5000 2757.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2021.02.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අනූහතර ලක්ෂ තිස්එක් දහස් නමසිය පනස් එකයි ශත හැත්තෑ නමයක (රු. 9,431,951.79) මුදල ද, 2021 පෙබරවාරි මස 02 දින සිට අංක 7950, 1364, 4823 සහ 1071 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙළොස් ලක්ෂ පනස් දහසක (රු. 1,250,000) මුදලක් සඳහා වාර්ෂික සියයට පහළොවයි දශම පහක් (15.5%) හා තවත් රුපියල් හැට පන් ලක්ෂ අනූ තුන් දහසක (රු. 6,593,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද,

ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.04.01 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2021.03.22 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.06.09 වැනි දින පෙ. ව. 11.00ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, ගන්නවාය කෝරළේ, මාවතගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසයේ කහපත්වල අංක 654 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කහපත්වල ග්‍රාමයේ පිහිටි ''දේවාලවත්ත '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. එම්. විජේබණ්ඩාර යන අය විසින් සාදන ලද 2013 ජනවාරි 25 දාතම හා අංක 656 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඒකාබද්ධ ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 1D හි ඉතිරි කොටස, නැගෙනහිරට : ඉලුක්වෙල සිට හතරලියැද්ද දක්වා දිවෙන ප්‍රධාන පාර නමුත් වඩා නිවැරදිව ලොට් 1D සහ හතරලියැද්ද සිට ඉලුක්වෙල දක්වා දිවෙන ප්‍රධාන පාර, දකුණට : වික්‍රමසිංහ විසින් හිමිකම් කියන කුඹුර සහ පාලිත වික්‍රමසිංහ විසින් හිමිකම් කියන ඉඩම (අංක 458 දරන පිඹුරේ ලොට් 1 C) බස්නාහිරට : බී. එම්. එම්. ජී. හේරත් විසින් හිමිකිම් කියන බලයලත් මානක තැන කේ. කේ. කනගසබෙයි යන අය විසින් සාදන ලද අංක 458 දරන උපබෙදුම් පිඹුරේ ලොට් 1D නමුත් වඩා නිවැරදිව වික්‍රමසිංහ විසින් හිමිකම් කියන කුඹුර සහ ලොට් 1D යන මායිම් තුළ පිහිටි මුළු ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) හෝ (හෙක්ටයාර් 0.0506) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 656 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව H58/71 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-91

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සහ 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

රනාල, නවගමුව, ශ්‍රී සුමනතිස්ස මාවතෙහි අංක 606B, සින්ටෙසි ලිමිටඩ් හි ණය වගකීම් වෙනුවෙන් රනාල, නවගමුව, ශ්‍රී සුමනතිස්ස මාවතෙහි අංක 606B පිහිටි උකස් කරන ලද දේපළ විකිණීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2021 අප්‍රේල් මස 01 දිනැති අංක 2,222 දරන *ගැසට් පත්‍රයේ* හා 2021.03.17 වැනි දින ''ඩේලිනිව්ස්'' ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද නිවේදන වලට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2021 ජූනි 01 වැනි දින පෙ. ව. 10.00 ට කොලොන්නාව විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් වෙන්දේසිකාර සමාගමේ එම්. එච්. තුසිත කරුණාරත්න මහතා විසින් වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### අංක 1648 දරන උකස් බැඳුම්කරයෙහි විස්තර කර ඇති ආකාරයට ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ, පල්ලෙ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමා තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි ''කොස්හේන සහ කොස්හේනවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. ඩබ්ලිව්. පී. පෙරේරා විසින් සාදන ලද 1978 අගෝස්තු 24 දිනැති අංක 384 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A උතුරට : ඔරුවල සිට නවගමුව දක්වා ප්‍රාදේශීය සභා පාර, එම ඉඩමේ ලොට් $A^1$ සහ $A^2$ ජී. ඉලෝසියස්ඤෝ සහ වෙනත් අයට අයිති T.P.234249 හි එම ඉඩමේ කොටසක් ද, ආර්. අන්තෝනිස් ප්‍රනාන්දුගේ T.P. 234249 හි එම ඉඩමේ කොටසක් සහ කොර්නේලිස් ප්‍රනාන්දුගේ ඉඩම ද, නැගෙනහිරට : එම පිඹුරේ ලොට් $A^2$, යක්දෙනියගෙ යසෝහාමිට අයිති T.P.183224හි ඉඩම, මීරියගොල්ලට අයිති T.P.153662 හි කුඹුර සහ කොර්නේලිස් ප්‍රනාන්දු සහ වෙනත් අයට අයිති කුඹුර ද, දකුණට : කොර්නේලිස් ප්‍රනාන්දු සහ වෙනත් අයට අයිති කුඹුර සහ කෝට්ටේ විහාරයේ භාරකරුවන් හිමිකම් කියන කුඹුර ද, බස්නාහිරට : එම පිඹුරේ $A^1$ සහ කෝට්ටේ විහාරයේ භාරකරුවන් හිමිකම් කියන කුඹුර ද මායිම්ව එකී අංක 384 දරන පිඹුරට අනුව අක්කර නවයයි රූඩ් දෙකක් සහ පර්චස් හයක (අ. 9, රූ. 2, පර්. 6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිල්ල සහ සියලු දෙයින් සමන්විත වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1669/41 දරන වෙළුමෙහි/පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එස්. එම්. ජලාලුදීන් විසින් මැනක දී මැන සාදන ලද 2006 ජූලි 13 දිනැති අංක 2587 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

එකී නවගමුව ග්‍රාමයේ පිහිටි කොස්හේන සහ කොස්හේනවත්ත නමැති ඉඩම්වල අංක 2587 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : පාර, අංක 384 දරන පිඹුරෙහි ලොට් A2 සහ ජී. ඉලෝ සිඤ්ඤෝ සහ වෙනත් අයට අයිති ඉඩම් ද වයි. යසෝහාමි, ආර්. ගුනේරිස් සහ වෙනත් අය සහ ආර්. සෝමපාල හිමිකම් කියන ඉඩම් ද, නැගෙනහිරට : අංක 384 දරන පිඹුරෙහි A2 ද ජී. ඉලෝ සිඤ්ඤෝ සහ වෙනත් අය ද වයි. යසෝහාමි, ආර්. ගුණේරිස් සහ වෙනත් අය ද ආර්. සෝමපාල ද හිමිකම් කියන ඉඩම් ද, ඇල සහ මීරියගොල්ල, කොර්නේලිස් ප්‍රනාන්දු සහ වෙනත් අය හිමිකම් කියන කුඹුර ද, දකුණට : ඇල, මීරියගොල්ල, කොර්නේලිස් ප්‍රනාන්දු සහ වෙනත් අයද කෝට්ටේ විහාරයේ භාරකරුවන් ද හිමිකම් කියන කුඹුරු සහ අංක 384 දරන පිඹුරෙහි ලොට් $A^1$ ද බස්නාහිරට : ඇල, කෝට්ටේ විහාරයේ භාරකරුවන් හිමිකම් කියන කුඹුර සහ අංක 384 දරන පිඹුරෙහි ලොට් $A^1$ ද මායිම්ව එකී අංක 2587 දරන පිඹුරට අනුව අක්කර නවයයි රූඩ් එකයි පර්චස් දහතක (අ. 9, රූ. 1, පර්. 17.0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිල්ල සහ සියලු දේ සමග වේ.

### *දෙවැනි උපලේඛනය*

ඉහත පළමු උපලේඛනයෙහි පූර්ණ වශයෙන් විස්තර කර ඇති ඉඩමට සහ පරිශ්‍රයට සවිකර ඇති යන්ත්‍රාගාරය සහ යන්ත්‍ර සූත්‍ර පහත දැක්වෙන දෙයින් සමන්විත වේ.

නිශ්චල යන්ත්‍රසූත්‍ර ලැයිස්තුව

| *Assets Description* | *Serial Number Cost* | *Capitalized Cost Rs.* |
|---|---|---|
| 1. CNC Machine | | |
| CNC Vertical Machine Center | Model - V 1000 | 58,000.00 |
| CNC Vertical Machine Center | Model - V 1000 | 58,000.00 |
| CNC Vertical Machine Center (Fright Charges) | Model - V 1000 | 2,153.72 |
| PAL Chgs. (CNC Vertical Machine Center) | Model - V 1000 | 2,999.01 |
| CNC Vertical Machine Center Model - V 1000 with MX5 Controller Cooling System | Model - V 1000 | 59,000.00 |
| CNC Vertical Machine Center with MX5 Controller Cooling System | Model - V 1000 | 59,000.00 |
| 2. Lamination Machine | | |
| Fabric Laminating Machine | TGHU 4701602 | 560,774.54 |
| Rollers for Lamination Machine | - | 32,829.94 |
| Rollers for Lamination Machine | - | 32,829.94 |

ඒ සමග ඉහත පළමු උපලේඛනයෙහි පූර්ණ වශයෙන් විස්තර කර ඇති ඉඩමට හා පරිශ්‍රයට දැනට සවිකර ඇති ඕනෑම හෝ කවරාකාරයක හෝ සියලු දේ ද ඇතුළත් වේ.

සම්බන්ධතා නිලධාරිනී,
අයකර ගැනීම්-ආයතනික.

ලංකා බැංකුව,
අයකර ගැනීම් - ආයතනික ඒකකය,
ලංකා බැංකු චතුරශ්‍රය,
අංක 1, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

05-02

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කිරුළපන කලාප 44, හයිලෙවල් පාර වරිපනම් අංක 293, 299, 293A, 293B, 293C දරන දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එච්. සුබසිංහ විසින් 2001 අගෝස්තු මස 18 වැනි දින මැන සාදන ලද අංක 1819 දරන පිඹුර ප්‍රකාර (මෙය බලයලත් මිනින්දෝරු ජී. ආර්. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 227 දරන 1967.06.10 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් 1 සහ 2 දරන කොටස් ඒකාබද්ධ කොට නැවත මැනීමක් සිදුකළ) ලොට් අංක 7571 දරන ඉඩම.

ප්‍රමාණය පර්චස් දහතුනයි දශම තුනයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 13.32) හෝ (හෙක්ටයාර් 0.03369) විශාල ඉඩම් කැබැල්ල සහ ඊට අයත් ඒ මත පිහිටි පස, ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මුදියන්සේලාගේ ඇන්ටනෙට් රෝමන් තල්වත්ත විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු ''බැඳුම්කරය'' වශයෙන් හඳුන්වනු ලබන) අංක 149 සහ 2012 සැප්තැම්බර් මස 07 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු ''උකස්කරු'' වශයෙන් හඳුන්වනු ලබන) කොළඹ 05, හයිලෙවල් පාර, අංක 293 දරන ස්ථානයේ පදිංචි රංචිගොඩ ගමගේ ආනන්ද යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී දරන ස්ථානයේ පිහිටි නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද, තවද, ඉහත සඳහන් උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදුකරන ලදුව, එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත ආපසු ගෙවීම් ඉහත කී රංචිගොඩ ගමගේ ආනන්ද යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින්ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් දේපළ **2021 ක් වූ ජුනි මස 15 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී** මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කිරුළපන වෙළඳපොළ අසල සිට හයිලෙවල් පාර ඔස්සේ කිලෝමීටර් 1.1ක් ගමන් කරන විට හමුවන ''නුගේගොඩ ප්‍රයිම් රෙසිඩන්ස් '' පසු කර මීටර් කිහිපයක් ඉදිරියට ගමන් කරන විට මෙම දේපළ පාරේ වම් පසට වන්නට පිහිටා ඇත. මෙම දේපළ වරිපනම් අංක 293, 293A, 293B, 293C සහ 299, අවිස්සාවේල්ල පාර.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල් සී හි තැන්පත් කළ යුතු ය.
(03) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(04) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500,
(07) නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු, රාජ්‍ය සහ වාණිජ බැංකු,

අංක 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 0773242954, 0112- 445393

කළමනාකරු, (නීති කටයුතු),
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී,
අංක 256, ශ්‍රීමත් රාමනාදන් මාවත,
කොළඹ 15.
දුරකථන අංක : 011 4682502/0114685590

05-176

---

## යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 124/1 දරන නැගෙනහිර බොරගොඩවත්ත ග්‍රාම නිලධාරි වසමේ බොරගොඩවත්ත සහ මැදිමුල්ල ගම්වල පිහිටි ''කෝන්ගහවත්ත, කොස්ගහවත්ත නොහොත් කුරුදුවත්තේ කොටසක්, බුළුගහවත්ත සහ ජම්බුගොඩැල්ල' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු

ඩබ්ලිව්. ඩී. එන්. සෙනෙවිරත්න විසින් මැන සාදන ලද අංක 7130 සහ 2007.01.21 දින දරන පිඹුරේ නිරූපිත ''ලොට් 01'' වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය පර්චස් විසිහතරයි දශම හයයි නවයක් (අ. 0, රූ. 0 පර්. 24.69) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලුදේත් සමග ය.

මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K50/96 යටතේ ලියාපදිංචි කර ඇත.

*දෙවන උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළයේ, දසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 124/1 දරන නැගෙනහිර බොරගොඩවත්ත ග්‍රාම නිලධාරී වසමේ බොරගොඩවත්ත සහ මැදිමුල්ල ගම්වල පිහිටි ''කෝන්ගහවත්ත, කොස්ගහවත්ත නොහොත් කුරුදුවත්තේ කොටසක්, බුළුගහවත්ත සහ ජම්බුගොඩැල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. එන්. සෙනෙවිරත්න විසින් මැන සාදන ලද අංක 8272 සහ 2010.09.03 දින දරන පිඹුරේ නිරූපිත ''ලොට් 01'' වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 1, පර්. 20) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

දිනුක් ''ඇලුමීනියම් මාර්කටිං'' යන නාමය සහ විලාසය යටතේ තනි හිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන මිනුවන්ගොඩ, අඹගහවත්ත, ගම්පහ පාර, අංක 42/බී/1 දරන ස්ථානයේ පදිංචි ජයකොඩි ආරච්චිගේ අෂාන් දිනුක ජයකොඩි (ජාතික හැඳුනුම්පත් අංක 770210860 V හිමි) (මෙහි මින්මතු ''බන්ධනදයි/උකස්කරු'' වශයෙන් හඳුන්වන) යන අය විසින් සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB676PQ දරන යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු යුනියන් බැංකුව වශයෙන් හඳුන්වන) වෙතින් කාලීන ණය පහසුකම් (මෙහි මින්මතු සාමූහික වශයෙන් ''එකී ණය පහසුකම්'' වශයෙන් හඳුන්වන) ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදයි/උකස්කරු විසින් මිනුවන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් යූ. බී. ප්‍රේමතිලක සහතික කරන ලද අංක 31079 සහ 2017.08.17 දිනැති මූලික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, එකී ණය පහසුකම් නිසා යුනියන් බැංකුව වෙත අයවිය යුතු මුදල සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි ඉහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ දෙක උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, යුනියන් බැන්ක් පී එල් සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් දේපළ පළමු උපලේඛනයේ දැක්වෙන දේපළ වර්ෂ 2021 ක් වූ ජුනි මස 02 වැනි දින පෙ.ව . 10.30 ට දෙවන උපලේඛනයේ දැක්වෙන දේපළ **වර්ෂ 2021 ක් වූ ජුනි මස 02 වැනි දින මධ්‍යාහ්න 12.00** ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*පළමුවන දේපළට පිවිසීම.*- මිනුවන්ගොඩ නගරයේ සිට ගුවන්තොටුපල පාර ඔස්සේ ඉදිරියට මීටර් 200ක් ගමන් කර දකුණු අත පැත්තට ඇති දාගොන්න පාරට හැරෙන්න. එම පාරේ කිලෝමීටර 1/2ක් ගමන් කර ශ්‍රී සුගත සිරි හිමි මාවතට හැරෙන්න. එම මාර්ගය සිමෙන්ති ගල් අතුරා ඇති ප්‍රාදේශීය සභා පාරකි. එම පාරේ මීටර් 200ක් පමණ ගමන් කරන විට මෙම දේපළ පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

*දෙවන දේපළට පිවිසීම.* - මිනුවන්ගොඩ නගරයේ සිට දිවුලපිටිය පාර ඔස්සේ ඉදිරියට කිලෝමීටර් 1/2ක් පමණ ගමන් කර වම් අත පැත්තට ඇති ගැමුණු මාවතට හැරෙන්න. එම පාරේ මීටර් 500ක් ගමන් කර වමට ඇති ග්‍රේවෙල් පාරට හැරෙන්න. එම පාරේ ඉදිරියට ශ්‍රී සුගත සිරි හිමි මාවත දක්වා මීටර් 150ක් ගමන් කර වාහන ගමන් කළ හැකි ග්‍රේවෙල් පාරට හැරෙන්න. එම මාර්ගය මීටර් 100ක් පමණ ගමන් කරන විට මෙම දේපළ එම පාර කෙළවරේ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුලත යුනියන් බැන්ක් ඔෆ් කලම්බො පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය .
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500,
(07) නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,

අංක 200, 2 වන මහළ, හල්ස්ඩ්‍රෝෆ් විදිය, කොළඹ 12 ,
දුරකතන අංක : 0773242954, 0112445393

නීති දෙපාර්තමේන්තුව,
යුනියන් බැන්ක් ඔෆ් කලම්බෝ පී එල් සී,
අංක 64, ගාලු පාර,
කොළඹ 03.
දුරකථන අංක : 0112347100.

05-174

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 522 දරන බටහිර පිටකෝට්ටේ ග්‍රාම නිලධාරී වසමේ පිටකෝට්ටේ පිහිටි මාරාගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. සුනිල් මුණසිංහ විසින් මැන සාදන ලද අංක 2015/77 සහ 2015.05.06 දින දරන පිඹුරේ නිරූපිත ලොට් X 2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය පර්චස් අටයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 8.5) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර මෙම දේපළ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A283/2 දරන වෙළුමේ/පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

තවද, පහත සවිස්තරව දක්වා ඇති ඉඩම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමගය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 522 දරන බටහිර පිටකෝට්ටේ ග්‍රාම නිලධාරී වසමේ පාගොඩ පාරේ, 5 වන පටුමගේ පිහිටි මාරාගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. සිවසුන්දරම් විසින් මැන සාදන ලද අංක 807 සහ 1966.04.02 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස, (අඩි 12 පළල පාර සඳහා වෙන්කිරීමක් වන) ප්‍රමාණය පර්චස් විස්සයි දශම පහයි අටක් (අ. 0, රූ. 0, පර්. 20.58) විශාල ඉඩම් කැබැල්ල වන අතර මෙය දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A283/3 දරන වෙළුමේ/පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාව තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රණාල ග්‍රාම නිලධාරී වසමේ රණාල පිහිටි ලුණුමඩලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 5897 සහ 2006.07.17 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය පර්චස් තිස් අටක් (අ. 0, රූ. 0, පර්. 38) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B880/78 දරන වෙලුමේ/පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් වසුන්දරා සාගරිකා ද සිල්වා විසින් සහතික කරන ලද අංක 200 සහ 2015 නොවැම්බර් මස 03 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් සහ ප්‍රසිද්ධ නොතාරිස් වසුන්දරා සාගරිකා ද සිල්වා විසින් සහතික කරන ලද අංක 203 සහ 2015 නොවැම්බර් මස 03 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත පළමු උපලේඛනයේ සහ මෙහි ඉහත දෙවන උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ඉහත කී පලිහේනගේ ප්‍රියන්ත කුමාර තිසේරා යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදයි/උකස්කරු ලෙස ක්‍රියාකරමින් ඉහත කී පලිහේනගේ ප්‍රියන්ත කුමාර තිසේරා යන අය විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 24 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, එකී බැඳුම්කර මගින් ඇප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් මත ආපසු ගෙවීම ඉහත කී පලිහේනගේ ප්‍රියන්ත කුමාර තිසේරා යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව, පළමු උපලේඛනයේ දැක්වෙන ලොට් X 2, දරන බිම් කොටස වර්ෂ **2021 ක් වූ ජුනි මස 08** වැනි දින **පෙ. ව. 11.30** ට දෙවන උපලේඛනයේ දැක්වෙන ලොට් 2 දරන බිම් කොටස වර්ෂ **2021 ක් වූ ජුනි මස 08** වැනි දින **ප. ව. 2.30** ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* -

*පළමුවන උපලේඛනය .-*

කොළඹ සිට පිටකෝට්ටේ හංදිය දක්වා ගමන් කර පාගොඩ පාරට දකුණට හැරී මීටර් 250ක් පමණ ගමන් කර නැවත ආනන්ද බාලිකා මාවතට දකුණට හැරී පාරේ දකුණු අත පැත්තේ පිහිටි 8 වන පටුමග මුණගැසෙන තුරු තවත් මීටර් 225ක් පමණ ගමන් කර එහි වමෙහි පැතිර පවතින දේපල වෙත ළඟාවීමට තවත් මීටර් 30ක් පමණ 8 වන පටුමග ඔස්සේ ගමන් කරන්න. පිහිටීම දක්වා මෝටර් රථ ප්‍රවේශය ලබාගත හැකි වේ.

*දෙවන උපලේඛනය .-*

ඔරුගොඩවත්ත හංදියේ සිට ලෝ ලෙවල් පාරේ (අවිස්සාවේල්ල පාර) කිලෝමීටර් 19ක් පමණ දුරක් ගමන් කර වැවල හංදිය දක්වා පැමිණ (නවගමුව දේවාලය ඔබ්බෙන් මීටර් 650ක් පමණ යන තැන පිහිටි) උඳුගොඩ පාරට දකුණට හැරී වමෙහි පැතිර පවතින අදාළ දේපළ වෙත ළඟාවීමට තවත් මීටර 800ක් පමණ ඉදිරියට ගමන් කරන්න. කඩුවෙල නගර මධ්‍යයේ සිට දුර කිලෝමීටර් 5 1/2ක් පමණ වේ.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල් සී හි තැන්පත් කළ යුතු ය.
(03) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(04) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500,
(07) නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3,500.

අනිකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, හල්ස්ඩ්‍රොෆ් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 0773242954, 0112- 445393

නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී,
අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.
දුරකථන අංක : 011 4218742.

05-178

---

**යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 479 F දරන අරුක්පිටිය ග්‍රාම නිලධාරි වසමේ, දකුණු තලංගම, නුගදෙණිය පාරේ පිහිටි ''නුගගහදෙණිය කුඹුර'' නොහොත් ''නුගගහඕවිට'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. තෙපුල්න්ගොඩ විසින් මැන සාදන ලද අංක 5093 සහ 2017.03.27 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 3C1 වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය (අ. 0, රූ. 0, පර්. 06.15) නොහොත් හෙක්ටයාර් 0.0156 විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු තිරවුරු ආදී සෑම සියලු දේත් සමග ය.

මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B1260/38 දරන වෙළුමේ/ පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 479 F දරන අරුක්පිටිය ග්‍රාම නිලධාරි වසමේ, දකුණු තලංගම නුගදෙණිය පාරේ පිහිටි ''නුගගහදෙණිය කුඹුර නොහොත් නුගගහඕවිට'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. තෙපුල්න්ගොඩ විසින් මැන සාදන ලද අංක 5093 සහ 2017.03.27 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 3C2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය (අ. 0, රූ. 0, පර්. 06.75) නොහොත් හෙක්ටයාර් 0.0170 විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු තිරවුරු ආදී සෑම සියලු දේත් සමග ය.

මෙම දේපළ හෝමාගම, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B1260/39 දරන වෙලුමේ/ පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත. ඇඹිලිපිටිය පල්ලේගම, ශෂිකලා ජේම්ස්, අංක 98/B දරන ස්ථානයේ වීරකොඩි ගමගේ ලහිරු නිර්මල (ජාතික හැඳුනුම්පත් අංක 890161138 V හිමි) (මෙහි මින්මතු ''බන්දනදායි/උකස්කරු'' වශයෙන් හඳුන්වන) යන අය විසින් සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB676PQ දරන යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු යුනියන් බැංකුව වශයෙන් හඳුන්වන) වෙතින් නිවාස ණය පහසුකමක් (ප්‍රතිලේඛනගත) සහ කාලීන ණය පහසුකමක් (ප්‍රතිලේඛනගත) (මෙහි මින්මතු සාමූහික වශයෙන් ''එකී ණය පහසුකම්'' වශයෙන් හඳුන්වන) ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායි/උකස්කරු විසින් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් නිරෝෂන් රණසිංහ බණ්ඩාර සහතික කරන ලද අංක 3770 සහ 2017.08.24 දිනැති මූලික උකස් බැඳුම්කරය සහ ඇඹිලිපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජී. දිලාන් ලංකා රවීන්ද්‍ර සහතික කරන ලද අංක 2581 සහ 2019.06.05 දිනැති ද්විතීයික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, එකී ණය පහසුකම් නිසා යුනියන් බැංකුව වෙත අයවිය යුතු මුදල සහ ඒ මත පොලිය ආපසු ගෙවීම සඳහා මෙහි ඉහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ දෙක ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් දේපළ පළමු උපලේඛනයේ දැක්වෙන දේපළ **වර්ෂ 2021 ක් වූ ජුනි මස 09 වැනි දින පෙ.ව. 10.30 ට.**

දෙවන උපලේඛනයේ දැක්වෙන දේපළ **වර්ෂ 2021 ක් වූ ජුනි මස 09 වැනි දින පෙ. ව. 11.30 ට** දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළවලට පිවිසීම.-* බත්තරමුල්ල හන්දියේ සිට මාලඹේ පාරට කි. මී. 2ක් පමණ දුරින් පිහිටි පැලවත්ත හන්දියෙන් දකුණට අකුරුගොඩ පාරේ මීටර් 800 ක පමණ හැරී අරුප්පිටිය හන්දියෙන් දකුණට හැරී නැවතත් දකුණට හැරී නුගදෙණිය පාරේ මීටර් 250ක් පමණ හැරී දේපළ වෙත ළඟා වන්න.

*ගෙවීම් කළ යුතු ආකාරය. -* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය :

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව 90% ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යූනියන් බැන්ක් ඔෆ් කළම්බො පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය .
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500,
(07) නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 3,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහළ, හල්ස්ඩ්‍රොෆ් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 0773242954 - 0112 - 445393

නීති දෙපාර්තමේන්තුව,
යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී,
අංක 64, ගාලු පාර,
කොළඹ 03.
දුරකථන අංක : 011 - 2347100.

05-177

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

**උපලේඛනය**

වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 16/1 දරන හැඳල ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි වරිපනම් අංක 16 දරන, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. සී. එස්. කුමාරසිරි විතානගේ විසින් ''කහටගහවත්ත'' නමැති ඉඩමට මැන සාදන ලද අංක 12248 සහ 2012 නොවැම්බර් මස 10 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් 01 දරන ඉඩමට (බලයලත් මිනින්දෝරු එල්. එම්. සී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1480 සහ 1996 මාර්තු මස 21 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් 08 දරන ඉඩම.

ප්‍රමාණය පර්චස් දහයයි දශම අටයි හතක (අ. 0, රූ. 0, පර්. 10.87) හෝ හෙක්ටයාර් 0.02754 ක විශාල ඉඩම් කැබැල්ල සහ ඊට අයත් ඒ මත පිහිටි පස, ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමගය.

බලයලත් මිනින්දෝරු ඊ. ඒ. ඕ. කොරෙයා විසින් මැන සාදන ලද 1179 සහ 1991 සැප්තැම්බර් මස 07 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් 05 දරන ඉඩම ද, බලයලත් මිනින්දෝරු එල්. එම්. සී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1480 සහ 1996 මාර්තු 22 වැනි දින දරන ලොට් 11 (අඩි 8ක් පළල පාර) මගින් ඇති මාර්ග අයිතිය ද සමග ය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සජානි කැමිලියා පීරිස් විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු ''බැඳුම්කරය'' වශයෙන් හඳුන්වනු ලබන) අංක 637 සහ 2016 නොවැම්බර් මස 04 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු ''උකස්කරු'' වශයෙන් හඳුන්වනු ලබන) කොළඹ 12, පරණ යොන් වීදිය, අංක 392/1/1 දරන ස්ථානයේ පදිංචි කරුපයියා රාජේෂ්වරී සහ උරුමයියා තිලගරත්නම් යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී දරන ස්ථානයේ පිහිටි නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද, තවද, ඉහත සඳහන් උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදුකරන ලදුව, එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත ආපසු ගෙවීම් ඉහත කී කරුපයියා රාජේෂ්වරී සහ උරුමයියා තිලගරත්නම් යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින්ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන්

දේපළ **2021 ක් වූ ජුනි මස 02 වැනි දින ප. ව. 2.30** ට දේපළ පිහිටි ස්ථානයේදී මාවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කැළණි පාලම අසල සිට 4 වන කිලෝමීටර් කණුව දක්වා ගමන් කර හැඳල පාරට ඇතුළුවී තවත් මීටර් 350ක් ඉදිරියට ගමන් කරන විට මෙම දේපළ පාරේ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු යි.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල් සී හි තැන්පත් කළ යුතු ය.
(03) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(04) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500,
(07) නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, හල්ස්ඩෝර්ෆ් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 0773242954, 0112- 445393

කළමනාකරු, (නීති කටයුතු),
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී,
අංක 256, ශ්‍රීමත් රාමනාදන් මාවත,
කොළඹ 15.
දුරකථන අංක : 011 4682502/011-4685590

05-179

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | ...137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | ... 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | ... 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* | |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | |
| I වැනි කොටස : | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 | |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 | |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 | |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 | |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | | 860 00 | 4 5 0 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | | 260 00 | 2 7 5 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 | |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 | |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 | |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 | |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | ... 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... | ... 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | ... 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... | ... 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... | ... 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... | ... 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... | ... 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... | ... 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... | ... 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2021 වර්ෂය** | | | |
| **මැයි** | 2021.05.07 | සිකුරාදා | 2020.04.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.05.13 | බ්‍රහස්පතින්දා | 2020.04.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.05.21 | සිකුරාදා | 2021.05.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.05.28 | සිකුරාදා | 2021.05.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **ජුනි** | 2021.06.04 | සිකුරාදා | 2020.05.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.11 | සිකුරාදා | 2020.05.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.18 | සිකුරාදා | 2021.06.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.25 | සිකුරාදා | 2021.06.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2021.07.02 | සිකුරාදා | 2020.06.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.09 | සිකුරාදා | 2020.06.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.16 | සිකුරාදා | 2021.07.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.22 | බ්‍රහස්පතින්දා | 2021.07.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.30 | සිකුරාදා | 2021.07.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.